# 多言語情報コーナー　（令和６年　４月号）

## 1. ළමා නිවාස මධ්‍යස්ථානය විවෘත කිරීම පිළිබඳව

2024 අප්‍රේල් මාසයේ සිට අපි ළමා නිවාස මධ්‍යස්ථානයක් විවෘත කරනු ලැබේ. ළමා පවුල් මධ්‍යස්ථානයේදී, ඔබ ගැබ් ගැනීමට පෙර සිට ඔබේ දරුවාට වයස අවුරුදු 18 වන තෙක් ආරක්ෂාකාරීව ඔබේ දරුවා ඇති දැඩි කිරීමට සහ ඔබේ කුසලතා වර්ධනය කර ගැනීමට අප උපදේශන සහ උපකාර ලබා දෙනු ඇත.

ළමා පවුල් මධ්‍යස්ථානයේ ‘‘ළමා රැකවරණ අංශය’’, ‘‘ළමා උපකාරක අංශය’’ සහ ‘‘ළමා පවුල් උපදේශන අංශය’’ යන තුන් ආකාරයෙන්ම ඔබට සහාය වීම සඳහා පද්ධතියක් ඇත.

‘‘ළමා රැකවරණ අංශය යනු ගැබ් ගැනීමට පෙර සිට සහ ’’ වයස අවුරුදු 0 සිට අවුරුදු 4 දක්වා, දරු ප්‍රසූතියෙන් පසුව දක්වා ළමුන් සම්බන්ධ උපදේශන සහාය ලබා දෙන්නෙමු.

මාතෘ සහ ළමා අත්පොතක් ලබා ගැනීමට , දරු ප්‍රසූතියට පෙර සහ පසු ඔවුන්ගේ ශාරීරික තත්ත්වය සහ හැඟීම් පිළිබඳව මව්වරුන් සහ පියවරුන් සමඟ සාකච්ඡා කිරීම, මට මව්කිරි සහ ළදරු ආහාර ගැන උපදෙස් ලබා දීම, දරුවන්ගේ වර්ධනය සහ සංවර්ධනය යනාදිය පිළිබඳ උපදේශන මෙම අංශය මගින් ලබා ගත හැක.

‘‘ළමා උපකාරක අංශය යනු ’’ වයස අවුරුදු 5 සිට 18 අතර ළමුන් සඳහා අවශ්‍ය උපදේශන සේවා ලබාදීම සිදුකරනු ලබයි.
‘‘ළමා සහ පවුල් උපදේශන අංශය යනු ’’ ළමා අපයෝජන, ගෘහස්ථ හිංසනය, තරුණ රැකවරණ ආදිය සඳහා උපදේශන ආදී සහාය ලබා දෙන්නෙමු.

ඊට අමතරව අපි "ළමා ප්‍රශ්න පිළිබද කමිටුවක් " පිහිටුවන අතර එමගින් ඔබේ දරුවා සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා යා යුතු ස්ථානය සම්බන්දව ඔබ කනස්සල්ලට පත්ව සිටී නම්,එවැනි අවස්ථාවල ඔබට ඒ පිළිබද විශේෂඥයින්ගේ සහාය ලබාගැනීමටත් ආදී කරු සම්බන්දවද ඒ ඒ ආයතන සමග සබදතා ඇතිකරදීම සිදුකරනු ලැබේ.

ළමා පවුල් මධ්‍යස්ථානය ඉමයිසුමි නගරයේ තොචිගි සෞඛ්‍ය හා සුභසාධන මධ්‍යස්ථානයේ දෙවන මහලේ පිහිටා ඇත.
ඔබට ඇති ඕනෑම ප්‍රශ්නයක් සඳහා කරුණාකර අප හා සම්බන්ධ වීමට හැකියාව ඇත.
එසේම, ඔබට පරිවර්තකයෙකු අවශ්‍ය නම්, කරුණාකර තොචිගි අන්තර්ජාතික සහයෝගිතා ආයතනය (තොචිගි කොකුසයි කෝරියු සෙන්තා )හි සහය ලබාගන්න.

## 2. තොචිසුකේ උපන්දින සාදය පැවැත්වීම පිලිබඳව

තොචිකි නගරය සංකේතවත් කරන තොචිසුකේ කැරැක්ටර් එක පිලිබඳව ගැන ඔබ දැනුවත්ද
තොචිසුකේ කැරැක්ටර් එකේ උපන් දිනය 2014 අප්‍රේල් 5 වෙනිදා වේ.

මෙම වසරේ 10 වන සංවත්සරය සනිටුහන් කරන අතර අප්‍රේල් 13 වන දින (සෙනසුරාදා) පෙරවරු 10 සිට සවස 3 දක්වා තොචිසුකේ @ මරුසිඑ ගේ උපන්දින සාදය තොචිගි නගරයේ ඇති ඉරිඉනේ ගම්මානයේ පවත්වාගෙන යනුලබන කලා හා සාහිත්‍ය ආයතනයෙ හි පැවැත්වෙනු ඇත.

තොචිසුකේ කැරැක්ටර් එකේ උපන් දින උත්සවයට අමතරව තොචිසුකේ කැරැක්ටර් එකේ මිතුරු චරිත වන සනොමරු වෙනුවෙන්ද වේදිකාවක් සහ ඡායාරූප රූගත කිරීමේ වේලාවක් පවත්වාගෙන යනු ලැබේ.

වර්ෂාවෙන් බාදා ඇති වුවහොත්,මෙම උත්සවය ස්ථානය තොචිගි ජනතා සහයෝගිතා මද්‍යස්ථානයේ පවත්වනු ලැබේ.

තොචිසුකේ දැන හඳුනා ගැනීමට මෙය හොඳ අවස්ථාවක් වන එබැවින් කරුණාකර මෙම අවස්ථාව දැකබලා ගැනීම ඉතා වැදගත් වේ.

මෙම ස්ථානය අසල වාහන නැවැත්වීමේ ස්ථානයක් නොමැති බව කරුණාවෙන් සලකන්න. කරුණාකර තොචිගි නගර ශාලාවට අයත් වාහන නැවැත්වීමේ ස්ථානය හෝ ස්ථානය අසල ගෙවන වාහන නැවැත්වීමේ ස්ථානයක් භාවිතා කරන්න.

## 3. උසුමරේ ජපන් පන්තිය පිලිබඳව

තොචිගි නගරයේ අන්තර්ජාතික සහයෝගිතා ඒකකය මගින් පවත්වාගෙන යනුලබන ජපන් පන්තිය වන උසුමරේ ඕහිරා ජපන් පන්තිය පවත්වනු ලබන ස්ථානය අප්‍රේල් මාසයේ සිට වෙනස් වේ.

නව ස්ථානය ඕහිරා නගරයේ කුරායි හි "ෆුරුසතෝ ෆුරෙඅයි ආයතනයේ පන්ති කාමර තුල වේ.
ෆුරුසතෝ ෆුරෙඅයි ආයතනය පිහිටා ඇත්තේ යුයු ප්ලාසා අසල ඇති ජපන් උද්‍යානය අසල වේ.

පන්ති පවත්වන ප්‍රමාණය දවස් දෙකේ සිට දවස් තුන දක්වා වෙනස් වනු ලැබේ.තවද සෑම මසකම පළමුවන දෙවන සහ හතරවන සෙනසුරාදා
දිනවල පෙරවරු 10:00 සිට 11:30 දක්වා පැවැත් වේ.

මීට අමතරව,උසුමරේ ප්‍රධාන පන්තිය සෑම බදාදා දිනකම, මසකට හතර වතාවක්, ඉවහුනේ හි තොචිගි නගරයේ ජනතා සහයෝගිතා මද්‍යස්ථානයේ 4 වන මහලේ පෙරවරු 10:00 සිට 11:30 දක්වා පැවැත්වේ.

උසුමරේ හි, අපගේ ඉලක්කය වන්නේ ඔබට එදිනෙදා ජීවිතයට අවශ්‍ය ජපන් භාෂාව ඉගෙන ගැනීමට උපකාර කිරීම වන අතර එමඟින් ඔබට ජපානයේ ආරක්ෂාකාරීව සාමයෙන් ජීවත් විය හැකිය.

ජපන් භාෂාව ඉගෙන ගැනීමේදී සියලු දෙනා සමග විනෝදයෙන් සහ සහයෝගයෙන් ඉගෙනගැනීම සිදුකරනු ලැබේ.

ජපන් භාෂාව හැදෑරීමට කැමති ඕනෑම කෙනෙකුට නොමිලේ සහභාගී විය හැක අතර ඔබගේ පැමිණීම අපි අගයකරනු ලැබේ.

## 4. ඔහිර නගර ශාලාව මගින් සිදුකරන භාෂා පරිවර්තක ක්‍රියාවලිය පිලිබඳව

ඔහිරා නගර ශාඛාවේ, කාර්ය මණ්ඩලය සහ විදේශීය ජාතිකයන් අතර සුමට සන්නිවේදනය සහතික කිරීම සඳහා පරිවර්තකයින් අප සතුව ඇත.

සෑම අඟහරුවාදා දිනකම උදේ 9 සිට 12 දක්වා චීන භාෂා පරිවර්තකයෙකු ලබා ගත හැකිය.
මීට අමතරව, සෑම බදාදා දිනකම සවස 3:00 සිට 5:00 දක්වා ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලබා ගත හැකිය.
විශේෂයෙන්ම, මාසයේ දෙවන බදාදා, ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු සවස 7:00 දක්වා ලබා ගත හැකිය.

පදිංචිය වෙනස් කිරීම පිළිබඳ දැනුම්දීම, my number කාඩ් එක සඳහා ඉල්ලුම් කිරීම, බදු කාරණා යනාදී ක්‍රියා පටිපාටි සඳහා පරිවර්තකයෙකු ඔබට සහාය වනු ඇත, එබැවින් හැකි නම්, පරිවර්තකයෙකු සිටින දිනයක පැමිණෙන්න.